# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2391/04 – 2024 ජූලි මස 01 වැනි සඳුදා – 2024.07.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2021/75

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ලංකා බැංකු සේවක සංගමය, (ඩී. ඩී. කේ. ජයවර්ධන මිය ඇතුළු නිලධාරීන් 04 දෙනා), අංක 20, පන්සල පාර, කොළඹ 10.

සහ

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, අංක 269, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, අංක 453/එෆ්, කුමාරි ජයරත්න මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

1A – G 042140 – 09 (2024/07)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2021/75

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලංකා බැංකු සේවක සංගමය, (ඩී. ඩී. කේ. ජයවර්ධන මිය ඇතුළු නිලධාරීන් 04 දෙනා), අංක 20, පන්සල පාර, කොළඹ 10.

සහ

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, අංක 269, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සේවය කරන ඩී. ඩී. කේ. ජයවර්ධන මිය ඇතුළු පහත නම් සඳහන් නිලධාරීන් 04 දෙනාගේ ණය අංශයේ සිදු වූ ව්‍යාපාර ණය මුදල් ලබා දීමේ සිද්ධියට අදාළව ලබා දී ඇති අභියාචනා විනය නියෝග ආයතනය විසින් ක්‍රියාත්මක නොකිරීම මගින් අසාධාරණයක් සිදු වී ඇත් ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

1. ඩී. ඩී. කේ. ජයවර්ධන මිය
2. එච්. ජී. එන්. එල්. වනිගසේකර මිය
3. ඩී. එල්. ඩයස් මයා
4. ඩී. එන්. ඩබ්. සෙනෙවිරත්න මිය

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 - 0001

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.